# දහම් පාසල් අවසාන විභාගය පසුගිය ප්‍රශ්න

## බුද්ධ ධර්මය හා පාලි භාෂා පරිචය

## 07 වන පාඩම ; අභිධර්මය

[[ 2024/2025 ]] 06 වන ප්‍රශ්නය

I අභිධර්මයේ ඉගැන්වෙන සත්‍යද්වය ලියා දක්වන්න.
II සතර පරමාර්ථ ධර්ම නම් කොට, ඒවා සංඛත අසංඛත වශයෙන් බෙදා දක්වන්න.
III අ) විසි නව වැදෑරුම් චිත්ත වර්ගීකරණයේ ප්‍රධාන ප්‍රභේද හතර ගෙනහැර දක්වන්න.
ආ) සිත්වල පවත්නා කර්ම,විපාක සහ ක්‍රියා භේද පහදන්න.
IV සිතේ ස්වභාවය හැදෑරීමේදී චෛතසිකවල උපයෝගීතාව අකුසල චෛතසික ඇසුරෙන් අනාවරණය කරන්න.

07 වන ප්‍රශ්නය

I මනෝ විඤ්ඤාණයට ආශය වන වස්තු රූපය නම් කරන්න.
II චෛතසිකවල ප්‍රධාන ලක්ෂණ හතර ලියන්න.
III අ) අඤ්ඤසමාන චෛතසික එම නමින් හැඳින්වීමේ හේතුව ලියා දක්වන්න.
ආ) සබ්බචිත්ත සධාරණ චෛතසික පිළිබඳව කෙටි විවරණයක් කරන්න.
IV ඔබ කැමති අකුසල චෛතසික තුනක් නම් කොට, ඒවා පුද්ගල සංවර්ධනයට හානි පමුණුවන ආකාරය පැහැදිලි කරන්න.

[[ 2020/2021/2022/2023 ]] 06 වන ප්‍රශ්නය

I සතර පරමාර්ථ ධර්ම නම් කරන්න.
II මාර්ග හා ඵල සිත අට නම් කරන්න.
III ඉහත දෙකෙහි සඳහන් කළ සිත්වලින් ප්‍රහාණය වන සංයෝජන ධර්ම වෙන් වශයෙන් දක්වන්න.
IV අ) සංයෝජන ධර්ම ප්‍රහීන කළ උත්තමයන් තිදෙනා නම් කරන්න.
ආ) එම උත්තමයන් තිදෙනා අතුරින් බුදුන් වහන්සේගේ දවස පහළ නොවන්නේ කවර උත්තමයෙක් දැයි සඳහන් කරන්න.

සමෙර සේනෝලේ හාමුදුරුවෝ

## 07 වන ප්‍රශ්නය

I සිත් භූමි වශයෙන් සිවු වැදෑරුම් වේ. එම භූමි හතර නම් කරන්න.
II සිත් අසූනවය එකී භූමි වලට අදාල වන පරිද්දෙන් බෙදා දක්වන්න.
III අභිධර්මයේදී හේතු නමින් දක්වන කුසලාකුසල ධර්ම වෙන් වෙන් වශයෙන් ලියා දක්වන්න.
IV අ) අකුසල,අහේතුක,සෝභන යන මේවා අයත්වන සිත් ගණය හඳුන්වන නම ලියන්න.
ආ) ඉහත (අ) හි සඳහන් සිත්වලට අදාළව ඒවා උපදින ස්ථාන සඳහන් කරන්න.

## [[ 2019/2020 ]] 06 වන ප්‍රශ්නය

I චෛතසිකවලට අයත් ප්‍රධාන ලක්ෂණ හතර දක්වන්න.
II අ) චෛතසික සංඛ්‍යාව දක්වන්න.
ආ) ඒවා ඇතුළත් ප්‍රධාන බෙදීම් තුන නම් කරන්න.
III අ) සියලුම සිත්වල යෙදෙන චෛතසිකයන් හඳුන්වන නම ලියන්න.
ආ) එම චෛතසික මොනවා දැයි සඳහන් කරන්න.
IV අ) කුසල් සිත් සමග යෙදෙන චෛතසික හඳුන්වන නම ලියන්න.
ආ) එයට අයත් සංඛ්‍යාව කොපමණදැයි පෙන්වා දෙන්න.
ඉ) අප්පමඤ්ඤා චෛතසික දෙක ලියා, ඒවා පිළිබඳව කෙටියෙන් හඳුන්වා දෙන්න.

## 07 වන ප්‍රශ්නය

I අභිධර්මයෙහි දැක්වෙන රූප පරමාර්ථ සංඛ්‍යාව කොපමණද?
II අභිධර්මයෙහි සඳහන් වන පරිදි ‘රූප’ යන පදය හඳුන්වා දෙන්න.
III එකී පරමාර්ථ බෙදීම් දෙකකට අයත් වේ.
අ) එකී බෙදීම් දෙක දක්වන්න.
ආ) සතර මහා භූත රූප නම් කරන්න.
IV සතර මහා භූත රූප වෙන් වෙන්ව හඳුන්වන්න.

## [[ 2018/2019 ]] 06 වන ප්‍රශ්නය

I සතර පරමාර්ථ ධර්ම නම් කරන්න.
II එම පරමාර්ථ ධර්මවලට අයත් සංඛ්‍යාව දක්වා, යහපත්,අයහපත් ක්‍රියා හඳුන්වන සිත්වර්ග දෙක ඉදිරිපත් කරන්න.

III මෝහ මූලික සිත් නම් කර, එම සිත්වල දක්නට ලැබෙන විශේෂ ලක්ෂණ සමග ඒවා කෙටියෙන් හඳුන්වන්න.

## [[ 2017/2018 ]] 05 වන ප්‍රශ්නය

I කාමලෝක නම් කරන්න.
II එම ලෝකවල පවත්නා සිත් සංඛ්‍යාව කොපමණද? ඒවා ප්‍රභේද වශයෙන් දක්වන්න.
III කුසල්-අකුසල් මූල නම් කර, ඊට අදාළ නොවන සිත් හඳුන්වන නම සමග එම සිත් සංඛ්‍යාව දක්වන්න.
IV ක්‍රියා සිත් තුන නම් කර, කෙටියෙන් හඳුන්වන්න.ඒවා ක්‍රියා සිත් වශයෙන් දැක්වීමට හේතුවද පහදා දෙන්න.

## [[ 2016/2017 ]] 06 වන ප්‍රශ්නය

I චෛතසිකයන්ගේ ප්‍රධාන ලක්ෂණ ගෙනහැර දක්වන්න.
II චෛතසික යනු කවරේදැයි පහදා, ඒවා ඇතුළත් ප්‍රධාන බෙදීම් සංඛ්‍යා සමග ඉදිරිපත් කරන්න.
III විරතිත්‍රය දක්වා, ඒවා පිළිබඳ හැඳින්වීමක් කරන්න.
IV සබ්බ චිත්ත සාධාරණ චෛතසික දක්වා, එම නම ව්‍යවාහර කිරීමට හේතුව පෙන්වා දෙන්න.

## [[ 2015/2016 ]] 06 වන ප්‍රශ්නය

I සිත භූමි වශයෙන් සතර වැදෑරුම් වේ. ඒ සතර නම් කරන්න.
II ඒවාට අදාළ සිත් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් ලියන්න.
III අසංඛාරික-සසංඛාරික, අහේතුක යන මේ සිත් කෙටියෙන් හඳුන්වන්න.
IV අහේතුක සිත්වලට අයත් ක්‍රියා සිත් තුන දක්වා, ඒවායින් නික්ලේශී උතුමන්ට පහළ වන ක්‍රියා සිත නම් කරන්න.

## [[ 2014/2015 ]] 06 වන ප්‍රශ්නය

I චෛතසික ලක්ෂණ හතර දක්වන්න.
II චෛතසිකයන්ගේ ප්‍රධාන බෙදීම් සමඟ ඉදිරිපත් කරන්න.

III ප්‍රකීර්ණක චෛත්සික නම් වශයෙන් ලියා, ඒවාට එම නම ව්‍යවහාර කිරීමේ හේතුව පෙන්වා දෙන්න.

IV විරති චෛතසික පිළිවෙළින් නම් කර,ඒවා පිළිබඳ හැඳින්වීමක් කරන්න.

## [[ 2013/2014 ]] 06 වන ප්‍රශ්නය

I භූත රූප නම් කරන්න.

II ඒවා සැකෙවින් හඳුන්වන්න.

III උපාදාය රූප යනු කවරේදැයි හඳුන්වා, එයට අයත් රූප සංඛ්‍යාවත්, විෂය රූප හතරත් නම් කරන්න.

IV රූප යන පදය අභිධර්මයේ විවරණය කොට ඇති අයුරු ලියා, චිත්ත චෛතසික සඳහා භාවිතා කරන වෙනත් නමක් පෙන්වා දෙන්න.

## [[ 2012/2013 ]] 06 වන ප්‍රශ්නය

I චෛතසිකයන්ගේ ප්‍රධාන ලක්ෂණ හතර ලියන්න.

II චෛතසික සංඛ්‍යාව කෙතෙක්ද?ඒවා බෙදා දක්වා ඇති ප්‍රධාන කොටස් තුන දක්වන්න.

III බොහෝ සිත්වල සුදුසු පරිදි පවත්නා චෛතසික හඳුන්වා දී ඇත්තේ කවර නමකින්දැයි පෙන්වා, එයට අයත් චෛතසික හතරක් නම් කරන්න.

IV විරති චෛතසික අයත් වන්නේ කවර චෛතසික කොටසකටදැයි දක්වා, එම විරති නම් කොට,ඒවා කෙටියෙන් හඳුන්වන්න.

## [[ 2011/2012 ]] 06 වන ප්‍රශ්නය

I දෙවැදෑරුම් දේශනා නම් කරන්න.

II එම දේශනාවන් හඳුන්වා,ඒවායින් අභිධර්මයට අයත් දේශනාව කුමක්දැයි ලියන්න.

III අභිධර්ම පිටකයට අයත් ග්‍රන්ථ තුනක් දක්වන්න.

IV චතුර්විධ භූමි සමඟ ඒවාට අයත් සිත් සංඛ්‍යාව කොපමණදැයි පෙන්වා දෙන්න.

## [[ 2010/2011 ]] 06 වන ප්‍රශ්නය

I අකුසල මූල නම් කරන්න.

II අකුසල සිත් කොපමණදැයි ලියා, සංඛ්‍යා සමග එහි ප්‍රභේද ද දක්වන්න.

III විචිකිච්ඡාව හා උද්දච්චය ඇතුළත් සිත් හඳුන්වන නම පෙන්වා, එම වචනයෙන් ප්‍රකාශ වන අදහස ඉදිරිපත් කරන්න.

IV අහේතුක සිත් ගණන හා ක්‍රියා සිත් තුන ලියා එම සිත්වලින් බුදුන් වහන්සේට මෙන්ම රහතන් වහන්සේලාට පහළ වන ක්‍රියා සිත නම් කරන්න.

## [[ 2009/2010 ]] 06 වන ප්‍රශ්නය

I චෛතසිකයන්ගේ ප්‍රධාන ලක්ෂණ හතර නම් කරන්න.

II චෛතසික යන්නෙහි අදහස දක්වා, ඒවා ඇතුළත් කර ඇති ප්‍රධාන කොටස් තුන නම් කරන්න.

III සබ්බචිත්ත සාධාරණ හා පකිණ්ණක නමින් දක්වා ඇති චෛතසික විශේෂය හඳුන්වා ඇති නම ලියා, සබ්බචිත්ත සාධාරණ චෛතසික නම් වශයෙන් ලියන්න.

IV විරති යන්නෙහි අර්ථය දක්වා, එයට ඇතුළත් විරතිත්‍රය නම් වශයෙන් ලියා කැමති විරති දෙකක් හඳුන්වන්න.

## [[ 2008/2009 ]] 06 වන ප්‍රශ්නය

I කවර නම් සිත් විශේෂයක් කාමාවචර නමින් හඳුන්වන්නේදැයි දක්වන්න.

II එයට අයත් සිත් සංඛ්‍යාව දක්වා එහි ප්‍රභේද නම් කරන්න.

III මෝහ මූලික සිත් දෙක ලියා, එම සිත්වල විශේෂයෙන් දක්නට ලැබෙන ලක්ෂණ දෙකද පෙන්වා ඒවා හඳුන්වන්න.

IV කුසලාකුසල සිත් මූලයන් නම් කර, ඒවා අභිධර්මයේදී හඳුන්වන්නේ කවර නමකින් දැයි පෙන්වා ඊට අදාළ නොවන සිත් සංඛ්‍යාවද දක්වන්න.

## [[ 2007/2008 ]] 06 වන ප්‍රශ්නය

I චෛතසිකයන්ගේ ප්‍රධාන ලක්ෂණ හතර දක්වන්න.

II චෛතසික සංඛ්‍යාව දක්වා, ඒවා ඇතුළත් කර ඇති ප්‍රධාන කොටස් තුන නම් වශයෙන් ලියන්න.

III සියළු සිත්වල යෙදෙන චෛතසික හඳුන්වා ඇත්තේ කවර නමකින්දැයි පෙන්වා දී එයට අයත් චෛතසික නම් වශයෙන් ලියා, ඒවායින් එකක් පැහැදිලි කරන්න.

IV කුසල් සිත් සමග යෙදෙන චෛතසික හඳුන්වා ඇත්තේ කවර නමකින්දැයි ලියා අප්පමඤ්ඤා ගණයට අයත්වන චෛතසික නම් කර ඒවා හඳුන්වන්න.

## [[ 2006/2007 ]]  05 වන ප්‍රශ්නය

I පරමාර්ථ ධර්ම සතර නම් කරන්න.
II ඒවායින් දෙකක් හඳුන්වන්න.
III කවර සිත් විශේෂය ක්‍රියා සිත් වශයෙන් නම් කර ඇත්තේදැයි ලියා එම සිත් පහළවන්නේ කාහටද යන බව දක්වන්න.
IV අරූපාවචර සිත් හතර නම් වශයෙන් ලියා එය දොළොස් වැදෑරුම් වන්නේ කවර භේදයකින්දැයි දක්වන්න.

## [[[[[ 2005 ]]]]]  05 වන ප්‍රශ්නය

I "කාමලෝක" නම් කරන්න.
II එම ලෝකයෙහි පවත්නා සිත් සංඛ්‍යාව කොපමණද? ප්‍රභේද වශයෙන් දක්වන්න.
III මෝහ මූලික සිත් දෙක ලියා, එම සිත්වල ස්වභාවය හඳුන්වන්න.
IV දානාදී දස පුණ්‍යක්‍රියා කිරීමේදී පහළවන සිත් නම් වශයෙන් දක්වන්න.

## [[[[[ 2004 ]]]]]  05 වන ප්‍රශ්නය

I "නාම ධර්ම" වශයෙන් හඳුන්වන පරමාර්ථ දෙක නම් කරන්න.
II අභිධර්මයෙහි රූප යන පදය විවරණය වන අයුරු දක්වන්න.
III රූප ධර්ම ග්‍රහණය කරගන්නා ආකාරය දක්වා මහා භූත රූප නම් වශයෙන් සඳහන් කරන්න.
IV නිෂ්පන්න රූපයන්ගේ සංඛ්‍යාවත් එහි අර්ථයත් ලියා ඒවා හට ගැනීමට හේතුවූ කරුණුත් පෙන්වා දෙන්න.

## [[[[[ 2003 ]]]]]  05 වන ප්‍රශ්නය

I අභිධර්මයෙහි දැක්වෙනලෙසට බුද්ධ දේශනාවේ මූලික ප්‍රභේද දෙක නම් කරන්න.
II එම දේශනාව කෙටියෙන් හඳුන්වන්න.

හිලව්වලේ ස්මෝර හාමුදුරුවෝ

III සංඛත්/අසංඛත ධර්මයන්ගේ ස්වභාවය පහදා සංඛත ධර්මයන් අනිත්‍ය ලෙස සැළකීමට හේතු සාධක දක්වන්න.

IV භූමි වශයෙන් සිතෙහි ප්‍රභේද දක්වා, ක්‍රියා සිත් පිළිබඳ කෙටි හැඳින්වීමක් කරන්න.

## [[[[[ 2002 ]]]]] 06 වන ප්‍රශ්නය

I සිතෙහි ප්‍රභේද සතර නම් කරන්න.

II ඒවායින් එකක් විස්තර කරන්න.

III චිත්තක්ෂණ හඳුන්වන්න.

IV විරති චෛතසික හඳුන්වා දෙන්න.

## [[[[[ 2001 ]]]]] 06 වන ප්‍රශ්නය

I සතර පරමාර්ථ නම් කරන්න.

II ඒවායින් එකක් විස්තර කරන්න.

III රූපාවචර පළමු කුසල් සිත නම් කරන්න.

IV රූපාවචර සිත කෙටියෙන් හඳුන්වන්න.

## [[[[[ 2000 ]]]]] 06 වන ප්‍රශ්නය

I අභිධර්මයේ නිදාන කථාව දක්වන්න.

II බුදුරදුන් අභිධර්මය මෙනෙහි කළ සතිය විස්තර කරන්න.

III සිතේ ප්‍රභේද ගෙනහැර දක්වන්න.

IV නාම ධර්ම හා රූප ධර්ම අතර අන්‍යෝන්‍ය සම්බන්ධතාවක් ඇත්දැයි පරීක්ෂා කරන්න.

## [[[[[ 1999 ]]]]] 05 වන ප්‍රශ්නය

I අභිධර්ම පිටකයට අයත් ග්‍රන්ථ සංඛ්‍යාව කොපමණද?

II එම ග්‍රන්ථ අතුරෙන් හතරක් නම් කරන්න.

III අභිධර්ම පිටකයට අවශාන වශයෙන් එක් කරන ලද ග්‍රන්ථය නම් කර, කතුවරයාගේ නම දක්වන්න.
IV අභිධර්මයේ ඉගැන්වෙන සතර පරමාර්ථ ධර්මයන් අතුරෙන් අසංඛත ධර්මය ගැන කෙටි හැඳින්වීමක් කරන්න.

## 06 වන ප්‍රශ්නය

I භූමි වශයෙඅන් සිත සිව්වැදෑරුම් කොට දැක්වෙන ආකාරය ඒ සිත් සංඛ්‍යාව සමග දක්වන්න.
II අහේතුක සිත් සංඛ්‍යාව දක්වා,එම සිත් අහේතුක සිත් වශයෙන් හැඳින්වෙන්නේ කවර හේතුවක් නිසා දැයි පැහැදිලි කරන්න.
III චෛතසිකයන්ගේ සංඛ්‍යාව දක්වා, සබ්බචිත්ත සාධාරණ චෛතසිකය ගැන හැඳින්වීමක් කරන්න.
IV සිත(චිත්ත) හා චෛතසික අතර පවතින අන්‍යෝන්‍ය සම්බන්ධය විස්තර කරන්න.

## [[[[[ 1998 ]]]]] 05 වන ප්‍රශ්නය

I චෛතසිකයන්ගේ සම්පූර්ණ සංඛ්‍යාව කොපමණද?
II ප්‍රකීර්ණක චෛතසික යන්නෙන් අදහස් කෙරෙන්නේ කිනම් චෛතසිකද?
III එම ප්‍රකීර්ණක චෛතසික අතුරෙන් හතරක් නම් කරන්න.
IV අභිධර්මයේ දැක්වෙන චිත්ත චෛතසික ධර්මයන්ගේ සම්බන්ධය පැහැදිලි කරන්න.

## 06 වන ප්‍රශ්නය

I භූත රූපයන්ගේ හා උපදාය රූපයන්ගේ සංඛ්‍යාව දක්වන්න.
II උපදාය රූප හතරක් නම් කරන්න.
III භූත රූපයන්ගේ ලක්ෂණ සැකෙවින් දක්වන්න.
IV හදයවත්ථු රූපය පිළිබඳව කෙටි විස්තරයක් කරන්න.

## [[[[[ 1997 ]]]]] 05 වන ප්‍රශ්නය

චෛතසිකයන්ගේ ප්‍රධාන ලක්ෂණ නම් කර, සබ්බචිත්ත සාධාරණ චෛතසික පිළිබඳ හැඳින්වීමක් කරන්න.

## 06 වන ප්‍රශ්නය

මහා භූත රූප සතර නම් කොට, උපාදාය රූප යනු කුමක්දැයි පැහැදිලි කරන්න.

## 07 වන ප්‍රශ්නය

පරමාර්ථ ධර්ම සතර ගෙනහැර දක්වා, මේවා අතුරෙන් දසවන ගණයට අයත්වන ධර්මය නම් කොට, එය පිළිබඳ විස්තරයක් කරන්න.

විල්වල ස්කෝලේ හාමුදුරුවෝ